# පූර්ව ක්‍රියාව - पूर्वक्रिया

12 පාඩම

1. ක්‍රියාවකට **-त्वा-** ප්‍රත්‍යය යෙදීමෙන් සාදා ගැනේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| **गच्छति** | - | යයි | **गत्वा** | - | ගොස් |
| **श्रृणोति** | - | අසයි | **श्रुत्वा** | - | අසා |
| **जयति** | - | දිනයි | **जित्वा** | - | දිනා |
| **भवति** | - | වෙයි | **भूत्वा** | - | වී |
| **नमति** | - | වඳියි/ නැමෙයි | **नत्वा** | - | වැඳ/ නැමී |
| **हरति** | - | ගෙනයයි | **हत्वा** | - | ගෙනගොස් |
| **पिबति** | - | බොයි | **पीत्वा** | - | බී |
| **धरति** | - | දරයි/ උසුලයි | **धृत्वा** | - | දරා/ උසුලා |
| **वारयति** | - | වළක්වයි | **वृत्वा** | - | වළක්වා |
| **स्मरति** | - | සිහි කරයි | **स्मृत्वा** | - | සිහිකොට |
| **ददाति** | - | දෙයි | **दत्वा** | - | දී |
| **करोति** | - | කරයි | **कृत्वा** | - | කර |
| **स्नाति** | - | නායි | **स्नात्वा** | - | නා |
| **ज्ञायते** | - | දැනගනී | **ज्ञात्वा** | - | දැනගෙන |
| **दृष्यते** | - | දකී | **दृष्ट्वा** | - | දැක |

2. මේ වාක්‍යවල පූර්වක්‍රියාව යෙදී ඇති අයුරු වටහා ගන්න.

**१. श्रामणेरः पर्णशालां गच्छति ।**
සාමණේර හිමි පන්සලට යයි.
**श्रामणेरः पर्णशालां गत्वा निसीदति ।**
සාමණේර හිමි පන්සලට ගොස් වැඩහිඳී.

**२. उपासकः धर्मं श्रुणोति ।**
උපාසකයා ධර්මය අසයි.
**उपासकः धर्मं श्रुत्वा प्रसीदति ।**
උපාසකයා ධර්මය අසා පැහැදෙයි.

३. दायकः दानं ददाति ।

දායකයා දන් දෙයි.

दायकः दानं दत्वा तुष्यति ।

දායකයා දන් දී සතුටු වෙයි.

४. शिष्यः गुरुं नमति ।

ශිෂ්‍යයා ගුරුතුමා නමදියි.

शिष्यः गुरुं नत्वा पाठं पठति ।

ශිෂ්‍යයා ගුරුතුමා නැමද පාඩම කියවයි.

५. कमारः अरीन् ज्यति ।

කුමරා සතුරන් දිනයි

कुमारः अरीन् जीत्वा राज्यं लभति ।

කුමරා සතුරන් දිනා රාජ්‍යය ලබයි.

3. **-त्वा-** ප්‍රත්‍යයට මුලින් **-इ-** ප්‍රත්‍යයක් යෙදීමෙන් ද පූර්වක්‍රියා තැනේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| पतति | - | වැටෙයි | पतित्वा | - | වැටී |
| रवति | - | නාද කරයි | रवित्वा | - | නාදකොට |
| वन्दति | - | වඳියි | वन्दित्वा | - | වැඳ |
| पठति | - | පාඩම් කරයි | पठित्वा | - | පාඩම් කොට |
| चरति | - | හැසිරෙයි | चरित्वा | - | හැසිර |
| धावति | - | දුවයි | धावित्वा | - | දුවගොස් |
| लिखति | - | ලියයි | लिखित्वा | - | ලියා |
| पचति | - | පිසයි | पचित्वा | - | පිස |
| पूजयति | - | පුදයි | पूजयित्वा | - | පුදා |
| रचयति | - | පිළියෙළ කරයි | रचयित्वा | - | පිළියෙළ කොට |
| वादयति | - | වාදනය කරයි | वादयित्वा | - | වාදනය කොට |
| वदति | - | කියයි | वदित्वा | - | කියා |
| पोषयति | - | පෝෂණය කරයි | पोषयित्वा | - | පෝෂණය කොට |
| वसति | - | වාසය කරයි | वसित्वा | - | වාසය කොට |
| खादति | - | කයි | खादित्वा | - | කා |

| | | | | | |
|---|---|---|---|---|---|
| वारयित्वा | - | වළක්වයි | वारयितवा | - | වළක්වා |
| गृह्णाति | - | ගනී | गृहीत्वा | - | ගෙන |
| रञ्जयति | - | පාට ගන්වයි | रञ्जयित्वा | - | පාට ගන්වා |
| पूरयति | - | පුරවයි | पूरयित्वा | - | පුරවා |
| भायति | - | බියවෙයි | भायित्वा | - | බිය වී |
| चिन्तयति | - | සිතයි | चिन्तयति | - | සිතා |
| ईक्षति | - | විමසීමෙන් බලයි | ईक्षित्वा | - | විමසීමෙන් බලා |
| गायति | - | ගයයි | गीत्वा | - | ගයා |

## बद्ध मत्स्यः

एकदा मनुष्याः नद्यायाः जालं ............... मत्स्यान् ग्रहणाय वायमन्ति। अथ एकः महामत्स्यः स्जहवशेन कथाचित् मत्स्या सह इतस्ततः ............... स्नेहेन ............... ताम् अनुगच्छति। सा मत्स्या पुरतः जालं ............... तं ............... अगमत्। स खलु रक्तः मत्स्यः तस्याः पश्चाद् ............... जालगर्भं एव प्रविष्टः। तस्मात् बहिः गन्तुम् अक्षमः ............... तस्मिन् एव जाले बद्धः। मनुष्याः तस्य जालं प्रविष्टभावं ............... सर्वे ............... उच्चैः घोषां ............... घोषां घोषां ............... चिन्तयति। अहं जालेन बद्धः। अधुना मरणं नियतं।किन्तु किञ्चित् इदं मां ............... न क्लमति। या पन सा मां ............... नूनं अन्यं प्रति गता इति मयि दुःसंकल्पं ............... मम मनः ............... मां ............... हिंसति इति॥

### ක්‍රියාකාරකම 1

1. ඉහත සඳහන් ඡේදයෙහි හිස්තැන් පිරවීමට අවශ්‍ය පූර්ව ක්‍රියා පද ලැයිස්තුවක් තේරුම් ද සමග පහත දී ඇත. එහි ඒ ඒ හිස්තැනෙහි අංකයට ගැළපෙන පූර්වක්‍රියාව ලැයිස්තුවෙන් හෝ හිස්තැනෙහි අංකය ඉදිරියෙහි ඇති කොටුව තුළ ලියන්න. ගුරුතුමාගේ උදව් ඇතිව වැරදි නිවැරදි කරගන්න. නිදසුනක් සපයා ඇත.

| | | | | |
|---|---|---|---|---|
| 1. | ज्ञात्वा (ඥාත්වා) | - | දැනගෙන | 8 |
| 2. | कृत्वा (කෘත්වා) | - | කොට | |
| 3. | पीडयित्वा (පීඩයිත්වා) | - | පීඩාකොට | |
| 4. | मिलितवा (මිලිත්වා) | - | රැස් වී | |

| | | | |
|---|---|---|---|
| 5. **श्रुत्वा** (ශ්‍රැත්වා) | - | අසා | |
| 6. **श्रन्त्वा** (ශ්‍රාන්ත්වා) | - | වෙහෙසකොට | |
| 7. **जनयित्वा** (ජනයිත්වා) | - | උපදවා | |
| 8. **वृत्वा** (වෘත්වා) | - | මගහැර | |
| 9. **क्षिप्त्व** (ක්ෂිප්ත්වා) | - | වීසිකොට | |
| 10. **चरित्वा** (චරිත්වා) | - | හැසිර | |
| 11. **दृष्ट्वा** (දෘෂ්ට්වා) | - | දැක | |
| 12. **क्रीडित्वा** (ක්‍රීඩිත්වා) | - | ක්‍රීඩාකොට | |
| 13. **गत्वा** (ගත්වා) | - | ගොස් | |
| 14. **बधित्वा** (බාධිත්වා) | - | බාධාකොට | |
| 15. **त्यक्त्वा** (ත්‍යක්ත්වා) | - | අතහැර | |
| 16. **भूत्वा** (භූත්වා) | - | වී | |

2. කොටු තුළ යෙදූ අංක අනුපිළිවෙළ අනුව නියමිත පද ඡේදයෙහි හිස්තැන්වල යොදා සම්පූර්ණ ඡේදය දේවනාගරී අකුරින් නැවත ලියන්න.

3. ගුරු උපදෙස් ඇති ව සම්පූර්ණ ඡේදයෙහි අර්ථ දක්වන්න.